# Joint Statement

**Hon Natalie Hutchins MP**
Minister for Government Services
Minister for Treaty and First Peoples
Minister for Prevention of Family Violence
Minister for Women

**Ngarra Murray**
Co-Chair of the
First Peoples' Assembly of Victoria

**Rueben Berg**
Co-Chair of the
First Peoples' Assembly of Victoria

Monday, 13 October 2025

Link: https://www.treatyvictoria.vic.gov.au/negotiations-finalised-victorias-treaty-9-september-2025

# වික්ටෝරියා ගිවිසුම සඳහා සාකච්ඡා අවසන් | 2025 සැප්තැම්බර් 9

වික්ටෝරියානු රජය සහ වික්ටෝරියාවේ මුල් ජනතාවගේ මහජන සභාව විසින් ඔස්ට්‍රේලියාවේ පළමු ගිවිසුම පිළිබඳ ප්‍රතිපත්තිමය එකඟතාවයකට පැමිණීමත් සමග වික්ටෝරියාවේ දශකයක් පුරා සිදු වූ ගිවිසුම් ක්‍රියාවලියේ ප්‍රධාන සන්ධිස්ථානයක් අත්කර ගෙන තිබේ.

සාකච්ඡා කරන ලද පළමු රාජ්‍ය ව්‍යාප්ත ගිවිසුම් ගිවිසුම ඔස්සේ වික්ටෝරියාවේ මුල් ජනතාවගේ මහජන සභාව හරහා මුල් ජනතාව සහ වික්ටෝරියානු රජය එක්ව, ගෞරවය, විශ්වාසය සහ අඛණ්ඩතාව මත පදනම් වූ නව සම්බන්ධතාවයක් ගොඩනැගීම සිදු කරයි. එමගින් අපගේ අතීතය පිළිගනිමින් සියලු වික්ටෝරියානුවන්ට එක්ව ඉදිරියට යාමට අවස්ථාවක් ලබා දෙයි.
රජය විසින් ප්‍රාන්ත ව්‍යාප්ත ගිවිසුම් පනත් කෙටුම්පත අද වික්ටෝරියානු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත. ප්‍රාන්ත ව්‍යාප්ත ගිවිසුම් පනත් කෙටුම්පත මගින් වික්ටෝරියාවේ  මුල් ජනතාවගේ ජනතා සභාව ස්ථිර කිරීමටත්, වික්ටෝරියාවේ මුල් ජනතාවට වඩාත් හොඳ ප්‍රතිඵල ලබා දීම සඳහා එහි වගකීම් පුළුල් කිරීමටත් යෝජනා කරයි.
පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව හරහා සම්මත කිරීමට යටත්ව, සාකච්ඡා කරන ලද ගිවිසුම් ගිවිසුම දෙපාර්ශ්වය විසින්ම අත්සන් කරනු ලැබේ.
ප්‍රතිපත්ති සහ වැඩසටහන් වඩාත් හොඳින් ක්‍රියාත්මක වන්නේ, ඒවායින් බලපෑමට ලක් වූ පුද්ගලයින්ට ඒවා ලබා දෙන ආකාරය සම්බන්ධයෙන් අදහස් පළ කිරීමට හැකියාව ඇති විටය - ඒ නිසා මෙම පනත් කෙටුම්පත මගින් මුල් ජනතාවට බලපාන මුලපිරීම් සහ සේවාවන් පිළිබඳ තීරණ ගැනීමේ බලය මුල් ජනතාවට අයත් මහජන සභාවට පැවරීමට යෝජනා කරයි.
පනත් කෙටුම්පත මගින් පුළුල් කරන ලද මහජන සභාව යෝජනා කරයි:

- මුල් ජනතා නියෝජනය සපයන ප්‍රජාතන්ත්‍රවාදීව තේරී පත් වූ සාමාජිකයින් විසින් මෙහෙයවනු ලැබීම
- මුල් ජනතාවට සෘජුවම බලපාන නිශ්චිත කරුණු පිළිබඳව තීරණ සහ නීති රීති සෑදීම
- ජාතික ගිවිසුම මගින් නියම කර ඇති පරිදි, පරතරය පියවා ගැනීම සඳහා වන ස්වාධීන වගවීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම
- මුල් ජනතාවට බලපාන නීති සහ ප්‍රතිපත්ති පිළිබඳව රජයේ දෙපාර්තමේන්තුවලින් උපදෙස් ලබා ගැනීම
- වික්ටෝරියානු නගර සහ කලාප පුරා සත්‍යය පැවසීම සහ සුව කිරීම සඳහා නායකත්වය දීම, කතන්දර සටහන් කර ගැනීම සහ පුළුල් මහජනතාවගේ අධ්‍යාපනයට සහාය වීම සඳහා මෙම තොරතුරු ලේඛනාගාරයක් රඳවා ගැනීම මෙයට ඇතුළත් වේ

- වික්ටෝරියානු  උරුම කවුන්සිලයට මුල් ජනතාවගේ පත්වීම් වැනි දැනට නම් කර ඇති මුල් ජනතාවගේ ආසන සඳහා යම් යම් ව්‍යවස්ථාපිත පත්වීම් සිදු කිරීම
- ආදිවාසී ප්‍රජා යටිතල පහසුකම් අරමුදල, වික්ටෝරියානු ආදිවාසී ගෞරව නාම ලේඛනය සහ NAIDOC සතිය මෙහෙයවීම
- අංශය පුරා නායකත්ව හැකියාව වැඩි දියුණු කිරීම සඳහා මුල් ජනතා ආයතනයක් සංවර්ධනය කිරීම.

වික්ටෝරියාවේදී, අපි දශකයකට ආසන්න කාලයක් තිස්සේ සත්‍යය සහ ගිවිසුම කරා දිගු හා ස්ථාවර මාවතක ගමන් කර ඇත්තෙමු. අපි දෙවරක් නීති සම්මත කර, ප්‍රතිපත්ති සකස් කර, රජය හරහා කැපවීම් සිදු කර ඇත්තෙමු.
ගිවිසුම වෙනුවෙන් ශක්තිමත් අත්තිවාරම් දැමීම සඳහා අප අවශ්‍ය කාලය ගත කර ඇති අතර, මෙම පනත් කෙටුම්පත මගින් මෙම ගමනේ ඓතිහාසික  සන්ධිස්ථානයක් නියෝජනය කරයි.